ලංකා බැංකුවේ පූර්ණ අනුබද්ධිත ආයතනයක් වන බීඕසී අයිටී සොලියුෂන්ස් (පුද්ගලික) සමාගම විසින් පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ඇති උද්‍යෝගිමත් සහ ඵලදායී ප්‍රතිඵල හඹායන පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## මෘදුකාංග සංවර්ධක (කොන්ත්‍රාත් පදනම - අවුරුදු 03යි)

**1. සේවක කාණ්ඩය**

- නිශ්චිත කාලසීමා කොන්ත්‍රාත්

**2. අධ්‍යාපනික සුදුසුකම්**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය, මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව, තොරතුරු පද්ධති හෝ පරිගණක ඉංජිනේරු විද්‍යාව සම්බන්ධයෙන් ලබාගත්, දෙවැනි පන්ති ඉහළ සාමාර්ථයක් හෝ ඊට ඉහළ මට්ටමේ සාමාර්ථයක්

  **හෝ**

  විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය, මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව, තොරතුරු පද්ධති හෝ පරිගණක ඉංජිනේරු විද්‍යාව සම්බන්ධයෙන් ලබාගත්, උපාධියක් සමඟ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ අවම වශයෙන් වසර 2ක පළපුරුද්ද (කරුණාකර ඔබේ අයදුම්පත සමඟ පිටපතක් අමුණන්න)

**3. පෙර සේවා පළපුරුද්ද**

පහත සඳහන් ක්ෂේත්‍ර අතරින් එකක හෝ වැඩි ගණනක අවම වශයෙන් වසර 2ක පළපුරුද්ද තිබීම වඩාත් සුදුසුය:

- මෘදුකාංග සංවර්ධනය (Web / Mobile / Enterprise) බලාපොරොත්තුවන තාක්ෂණය: Java, J2EE, Spring MVC, .NET, C#, HTML5, CSS, JavaScript, React, Angular, Flutter.
- දත්ත පද්ධති කළමනාකරන: Oracle, MySQL, SQL Server.
- Cloud සහ DevOps තාක්ෂණයන් (AWS, Azure, Docker, Kubernetes)
- API සංවර්ධනය හා සමෝධානය.
- ජංගම යෙදවුම් සංවර්ධනය (Android/iOS)

**4. වෙනත් කරුණු**

- ගැටලු විසඳීමේ සහ විශ්ලේෂණාත්මක හැකියාවන්
- ඩිජිටල් බැංකුකරණය සහ කර්මාන්ත පද්ධති පිළිබඳ දැනුම
- ක්ෂුද්‍ර සේවා නිර්මාණ ශිල්පය පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් වනු ඇත
- Agile/Scrum ක්‍රමවේදයන් පිළිබඳ හුරුව
- AI/ML, Big Data, Blockchain සමඟ කටයුතු කර තිබීම අමතර සුදුසුකමක් වනු ඇත

**5. වයස් සීමාව**

- අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වනවිට අවුරුදු 35 හෝ ඊට අඩු

**6. ගිවිසුම් කාලපරිච්ඡේදය**

- සම්පූර්ණ ගිවිසුම් කාලපරිච්ඡේදය වසර 03ක් වනු ඇත (වාර්ෂික ප්‍රගති සමාලෝචනයට යටත්ව)

**7. වැටුප් පරිමාණය**

- සාකච්ඡා කරගත හැකිය: අයදුම්කරුගේ නිපුණතාව මත ආකර්ෂණීය වැටුප් පැකේජයක් පිරිනැමෙනු ඇත

---

**අයදුම්කිරීමේ පටිපාටිය**

- අයැදුම්කරුවන් විසින් සිය අයදුම්පත්, උපාධි සහතික සහ අවශ්‍ය වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික මෙන්ම අදාළ සෙසු සියලු අධ්‍යාපන සහතිකවල පිටපත් සමඟ අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද සනාථ කරන ලියකියවිලිවල ඡායාපිටපත් සමඟ උප්පැන්න සහතිකයේ සහ ජාතික හැඳුනුම්පතේ පිටපත් **career@bocits.lk** යන ඊමේල් ලිපිනයට හෝ අයදුම් කරන තනතුර ලිපිකවරයේ වම් ඉහළ කෙළවරෙහි සඳහන් කොට පහත ලිපිනයට **2026/02/24** දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතුය.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ඉහත සඳහන් සුදුසුකම් සපුරා නොමැති නම් හෝ අදාළ ලියකියවිලිවල ඡායා පිටපත් රහිතව ඉදිරිපත් කරනු ලබන හෝ සාවද්‍ය තොරතුරු සපයන ලද සහ අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පසුව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් නැවත දැනුම්දීමකින් තොරව බඳවා ගැනිමේ කාර්ය පාටිපාටියේ ඕනෑම අවස්ථාවක ප්‍රතික්ෂේප කරනු ලැබේ.**


**ප්‍රධාන විධායක නිලධාරී**
**බීඕසී අයිටී සොලියුෂන්ස් (පුද්ගලික) සමාගම,**
18 වන මහල, ලංකා බැංකුව - ප්‍රධාන කාර්යාලය,
"ලංකා බැංකු චතුරස්‍රය", අංක 01, ලංකා බැංකු මාවත, කොළඹ 01.
දුරකථන: 011 220 3816, 076 542 5116
ඊමේල්: career@bocits.lk


BOC IT Solutions (Pvt) Ltd
(A fully owned subsidiary of the Bank of Ceylon)

- කිසියම් හෝ ආකාරයකින් බලපෑම් කිරීම වහාම නුසුදුසුකමක් බවට පත්විය හැකිය. • තෝරාගත් අපේක්ෂකයින් පමණක් කැඳවීමේ අයිතිය සමාගම සතුය.
- පිරවිය යුතු තනතුරු සංඛ්‍යාව හෝ බඳවා ගැනීම කල්දැමීමේ/ අවලංගු කිරීමේ අයිතිය සමාගම සතුය.